## අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

### ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 වැඩපරීක්ෂක තනතුර සඳහා බඳවා ගැනීම - (විවෘත) 2025

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ වැඩ පරීක්ෂක III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු 13ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් ලබාදෙන ලකුණු මත තෝරා ගනු ලබයි. පත්වීම ක්‍රියාත්මකවන දිනය ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2310/29 සහ 2022.12.14 දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, 2012.02.16 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 නිලධර ගණයේ වැඩ පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ නියමයන්ට හා කොන්දේසිවලට ද එම පටිපාටියට කර ඇති හෝ මින් මතුවට කෙරෙන්නා වූ සංශෝධනවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයෙකු තනතුරෙහි III ශ්‍රේණිය සඳහා පත් කෙරෙනු ඇත.

2.2 මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. එහෙත් නව පත්වීම්ලාභීන් හට පිරිනමනු ලබන විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට පත්වීම්ලාභීන් යටත් විය යුතු වේ. වැන්දඹු හා අනත්දරු / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

2.3 මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

2.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

2.6 රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

2.7 සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, තෝරාගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලයේ වසර පහක (05) අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වැඩ පරීක්ෂක ස්ථානමාරු පටිපාටියට අනුව වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

03. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන II අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය,

රු. 45,230-10 x 540-11 x 630-10 x890-10 x 1190- රු. 78,360/- (MN 1-2025) වේ.

එමෙන්ම වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමිවේ.

04. බඳවා ගැනීමේ සුදුසුකම්

4.1 අධ්‍යාපන සුදුසුකම් :

(අ) i. සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව,
ii. ගණිතය සහ
iii. තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින්(06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

4.2 පළපුරුද්ද :
රජය විසින් පිළිගත් ආයතනයක සමාජ සේවා හා සමාජ වැඩ පිළිබඳව වසරක පළපුරුද්ද.

4.3 වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතුය.

4.4 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

4.5 අනෙක් සුදුසුකම් :

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස් වරයා විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණුවල කුසලතාව මත පත් කිරීම කරනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දීමේ ක්‍රමය: ලකුණු 100

| | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 01. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් :<br>රජයේ පිළිගත් ආයතනයකින් | | 20 |
| | i. විශේෂවේදි උපාධිය | 20 | |
| | ii. උපාධිය | 15 | |
| | iii. ඩිප්ලෝමා පාඨමාලා (මාස 06 හෝ ඊට වැඩි) | 10 | |
| | iv. සහතික පත්‍ර පාඨමාලා (මාස 03 හෝ ඊට වැඩි) | 05 | |
| | v. මූලික සුදුසුකමට අමතරව සහ අ.පො.ස.(උ/පෙළ)ප්‍රතිඵල අනුව | | |
| | විශිෂ්ට සාමාර්ථ (A) (එක් විෂයකට ලකුණු 03 බැගින්) | 06 | |
| | අධි සම්මාන සාමාර්ථ (B) (එක් විෂයකට ලකුණු 02 බැගින්) | 04 | |
| | සම්මාන සාමාර්ථ (C) (එක් විෂයකට ලකුණු 01 බැගින්) | 02 | |
| | සාමාන්‍ය සාමාර්ථ (S) (එක් විෂයකට ලකුණු 0.5 බැගින්) | 01 | |
| | (i සිට iv දක්වා ලබා ගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ) | | |
| 02. | ඉංග්‍රීසි භාෂා දැනුම : | | 20 |
| | i. වසරක් හෝ ඊට වැඩි උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ මූලික උපාධිය ඉංග්‍රීසි භාෂාවෙන් හදාරා තිබීම | 20 | |
| | ii. වසරක හෝ ඊට වැඩි ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම | 18 | |
| | iii. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ ප්‍රධාන විෂයයක් ලෙස සමත් වී තිබීම | 15 | |
| | iv. සහතික පත්‍ර පාඨමාලා (මාස 06 හෝ ඊට වැඩි) | 12 | |
| | v. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මානයක් හෝ ඊට වැඩි සාමාර්ථයක් සඳහා | 10 | |
| | vi. අ.පො.ස.(උ/පෙළ) විභාගයේ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සමත් වීම | 05 | |
| | vii. මූලික සුදුසුකමට අමතරව අ.පො.ස.(සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි විෂය සඳහා | | |
| | විශිෂ්ට සාමාර්ථ (A) | 08 | |
| | අධි සම්මාන සාමාර්ථ (B) | 06 | |
| | සම්මාන සාමාර්ථ (C) | 04 | |
| | සාමාන්‍ය සාමාර්ථ (S) | 02 | |
| | (ලබාගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | | |

| | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 03 | පරිගණක දැනුම :<br>රජය පිළිගත් ආයතනයක් මගින්<br><br>i. උසස් ඩිප්ලෝමා පාඨමාලාවක් (වසරක් හෝ ඊට වැඩි)<br>ii. ඩිප්ලෝමා පාඨමාලාවක් (වසරක් හෝ ඊට වැඩි)<br>iii. සහතිකපත්‍ර පාඨමාලාවක් (මාස 06 හෝ ඊට වැඩි)<br>iv. වෙනත් පාඨමාලා (මාස 03- 06 අතර)<br>(ලබා ගත් ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදේ) | <br><br><br>25<br>20<br>10<br>05 | 25 |
| 04. | අතිරේක පළපුරුද්ද :<br>සමාජ සේවා හා සමාජ වැඩ සම්බන්ධයෙන් ක්‍රියාකාරී දායකත්වය<br>(වසරක පළපුරුද්දට අමතරව වසරකට ලකුණු 06 බැගින් වසර 05 ක් දක්වා) | <br>30 | 30 |
| 05. | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අනුමැතිය පරිදි නායකත්වය, පෞරුෂය හා සන්නිවේදන කුසලතා | 05 | 05 |
| 06 | එකතුව | | 100 |

06. අයදුම් කිරීමේ ක්‍රමය

අයදුම්පත්‍රය මේ සමඟ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල විය යුතු අතර, සෙ.මී. 22 -29 ප්‍රමාණයේ A4 කඩදාසිවල සකස් කළ යුතු වේ. අදාල තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන මූලික සුදුසුකම් නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන හා ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලැබේ.

07. අයදුම්පත් යොමු කිරීම :

7.1 මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් **2025.10.24** දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. :

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්<br>
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව<br>
15 මහළ<br>
මෙහෙවර පියෙස<br>
නාරාහේන්පිට<br>
කොළඹ 05

7.2 අයදුම්පත් කැඳවන අවසාන දිනය **2025.10.24** වේ. එම දිනට අදාළ සුදුසුකම් සියල්ල සම්පූර්ණ කර තිබිය යුතුය.

7.3 දැනට රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/සංස්ථා/ මණ්ඩල/සිවිල් ආයතන) නියුතු නිලධාරින්ගේ අයදුම්පත් අපේක්ෂකයා තෝරා ගතහොත් එම ආයතනයෙන් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

7.4 අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ " වැඩපරීක්ෂක තනතුර සඳහාවන බඳවා ගැනීම - (විවෘත) - 2025 " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**සැළකිය යුතුය :**

I අයදුම්පත්‍රයේ සඳහන් අංක 02 සිට අංක 04 දක්වා වූ සුදුසුකම් සනාථ කර ගැනීම සඳහා සහතිකපත්වල ඡායාස්ථ පිටපත් අයදුම්පත්‍රය සමග, අයදුම්කරු විසින් සහතික කර එවිය යුතුය. ඒ අනුව සුදුසුකම් පරීක්ෂා කර ඉහළම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 1:10 අනුපාතයට අනුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

II සහතික පත්වල මුල් පිටපත් ඉල්ලූ අවස්ථාවල දී ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

III රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුක්ත නිලධාරින් විසින් තමන්ගේ දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් අයදුම්පත් එවිය යුතුය.

IV රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ හා ඊට සිදු කර ඇති සංශෝධනයන් හී කොන්දේසි මෙම තනතුර සඳහා අදාළ වේ.

(මෙම *ගැසට්* නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.)

දිලාන් ගුණරත්න,<br>
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්

2025 සැප්තැම්බර් මස 30 වැනි දින.